

# 2013 මහ බැංකු වාර්තාවෙන් පිළිබිඹු වන
# ශ්‍රී ලංකා ආර්ථිකය


ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව


2014 අප්‍රේල් මස 08 වැනි දින

# ශ්‍රී ලංකා ආර්ථිකය 2013 වසරේ දී සියයට 7.3 කින් වර්ධනය වෙමින් ශක්තිමත්ව යථා තත්ත්වයට පත්විය...


**දළ දේශීය නිෂ්පාදිතය සහ ආංශික වර්ධනය - 2011-2013**

| ප්‍රධාන අංශ | 2011 | 2012(අ) | 2013(ආ) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | වාර්ෂික | වාර්ෂික | Q1 | Q2 | Q3 | Q4 | වාර්ෂික |
| **කෘෂිකාර්මික** | **1.4** | **5.2** | 3.4 | -1.1 | 7.2 | 10.4 | **4.7** |
| **කර්මාන්ත** | **10.3** | **10.3** | 10.7 | 10.1 | 8.1 | 10.7 | **9.9** |
| **සේවා** | **8.6** | **4.6** | 4.3 | 6.6 | 7.9 | 6.5 | **6.4** |
| **ද.දේ.නි.** | **8.2** | **6.3** | 6.1 | 6.8 | 7.9 | 8.2 | **7.3** |

*(අ) සංශෝධිත*
*(ආ) තාවකාලික*

*මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

# 2013 වසරේ ආර්ථික වර්ධනය සඳහා සියලුම අංශ ධනාත්මකව දායක විය...




**<u>කෘෂිකාර්මික හා ධීවර අංශය</u>: 4.7% ↑**

- *වී :* 19.5% ↑
- *ධීවර* : 6.2% ↑
- තේ : 3.6% ↑
- **පොල්** : 16.1% ↓
- *රබර් :* 9.1% ↓


**<u>කර්මාන්ත අංශය</u>: 9.9% ↑**

- *ඉදිකිරීම්* : 14.4% ↑
- *පතල් හා කැණීම්* : 11.5% ↑
- *විදුලි බලය* : 11.3% ↑
- *කර්මාන්තශාලා නිෂ්පාදන* : 7.9% ↑

**<u>සේවා අංශය</u> : 6.4% ↑**

- *සංචාරක (හෝටල් සහ ආපනශාලා)* : 22.3% ↑
- *ප්‍රවාහනය* : 9.4% ↑
- තොග සහ සිල්ලර වෙළෙඳාම : 5.5% ↑
- *භාණ්ඩ මෙහෙයවීම* : 3.1% ↑


# ඒක පුද්ගල ආදායම එ.ජ.ඩොලර් 3,000 සීමාව ඉක්මවීය...



# නොකඩවා පස්වන වසරටත් පාරිභෝගික මිල උද්ධමනය තනි අංකයක පැවතුණි...


2013 වසර අවසානයට ...

- මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ): 4.7% *(2012 සියයට 9.2)*
- වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය: 6.9% *(2012  සියයට 7.6)*
- මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය): 2.1% *(2012 සියයට 7.6)*




**දළ දේශීය නිෂ්පාදිතයේ  අවධමනකය 2012 වසරේ වූ සියයට 8.9 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී සියයට 6.7 ක් විය.**

# දරිද්‍රතා මට්ටම අඛණ්ඩවම පහළට...




මූලය: කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- ආදායම් විෂමතාවයේ අඩුවීම පිළිබිඹු කරමින් ගිණි සංගුණකය 2009/10 පැවති 0.49 සිට 2012 වසරේ දී 0.48 දක්වා වර්ධනය විය.

# සේවා වියුක්ති අනුපාතය අඩු මට්ටමක පැවතුණි...




# අපනයන ආදායම 2012 වසරේ වාර්තා වූ සියයට 7.4 කින් අඩුවීමට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 6.4 කින් වර්ධනය විය...

**අපනයන ප්‍රවණතා (එ.ජ.ඩො. මිලියන)**

| වර්ගය | 2012 | 2013 | වර්ධනය (%) |
|---|---|---|---|
| **කෘෂිකාර්මික නිෂ්පාදන** | 2,331.5 | 2,581.1 | 10.7 |
| එයින්, | | | |
| තේ | 1,411.9 | 1,542.2 | 9.2 |
| | | | |
| **කාර්මික නිෂ්පාදන** | 7,371.2 | 7,749.4 | 5.1 |
| එයින්, | | | |
| රෙදිපිළි සහ ඇඟළුම් | 3,991.1 | 4,508.3 | 13.0 |
| රබර් නිෂ්පාදන | 859.4 | 887.8 | 3.3 |
| ආහාර, පානවර්ග සහ දුම්කොළ | 284.3 | 235.2 | -17.3 |
| | | | |
| **ඛනිජ නිෂ්පාදන** | 61.3 | 51.6 | -15.9 |
| | | | |
| **මුළු අපනයන** | 9,773.5 | 10,394.3 | 6.4 |

**අපනයන වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)**




# 2013 වසරේ දී ආනයන වියදම සියයට 6.2 කින් අඩු විය ...

**ආනයන වියදම (එ.ජ.ඩො.මිලියන)**


| වර්ගය | 2012 | 2013 | වර්ධනය (%) |
|---|---|---|---|
| **පාරිභෝජන භාණ්ඩ** | 2,995.2 | 3,182.5 | 6.3 |
| *එයින්,* | | | |
| ආහාර හා පානවර්ග | 1,304.4 | 1,368.1 | 4.9 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 1,690.8 | 1,814.4 | 7.3 |
| | | | |
| **අන්තර් භාණ්ඩ** | 11,577.6 | 10,553.7 | -8.8 |
| *එයින්,* | | | |
| ඉන්ධන | 5,044.6 | 4,308.2 | -14.6 |
| රෙදිපිළි හා ඇඟළුම් | 2,266.4 | 2,045.8 | -9.7 |
| | | | |
| **ආයෝජන භාණ්ඩ** | 4,589.8 | 4,252.7 | -7.3 |
| *එයින්,* | | | |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,356.0 | 2,221.9 | -5.7 |
| ප්‍රවාහන උපකරණ | 991.9 | 667.8 | -32.7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,237.4 | 1,357.2 | 9.7 |
| | | | |
| **ආනයන** | **19,190.2** | **18,002.8** | **-6.2** |

**ආනයන වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය )**



# 2013 වසරේ දී වෙළෙඳ හිඟය කැපීපෙනෙන ලෙස අඩු විය...


වෙළෙඳ හිඟය 2012 වසරේ පැවති එ.ජ.ඩොලර් මිලියන 9,417 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 7,609 දක්වා සියයට 19.2 කින් අඩු විය...



# සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් බිලියන 6.4 ක් දක්වා සියයට 7.0 කින් වර්ධනය විය...


- විදේශ සේවා සඳහා විදේශගතවීම 2013 වසරේ දී 293,105 ක් වූ අතර, එය 2012 ට සාපේක්ෂව සියයට 3.8 ක වර්ධනයකි.

- වෘත්තීය සහ නිපුණතා සහිත සංක්‍රමණිකයන්ගේ වර්ධනය සියයට 24.6 කි.




# 2013 වසරේ දී සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් බිලියන 1.7 සීමාව ඉක්මවීය...

- **2013 වසරේ දී සංචාරක පැමිණීම්**
  - මිලියන 1.27 ක් දක්වා සියයට 26.7 කින් ඉහළ ගියේය.
- **සංචාරක ඉපැයීම්**
  - එ.ජ.ඩොලර් මිලියන 1,715 ක් දක්වා සියයට 65.1 කින් වර්ධනය විය





| රට | 2008 | 2013 |
|---|---|---|
| ඉන්දියාව | 85,238 | 208,795 |
| එක්සත් රාජධානිය | 81,331 | 137,416 |
| ජර්මනිය | 30,625 | 85,470 |
| මාලදිවයින | 31,564 | 79,474 |
| ප්‍රංශය | 10,594 | 64,388 |
| චීනය | 9,812 | 54,288 |
| ඕස්ට්‍රේලියාව | 19,536 | 54,252 |
| රුසියාව | 15,797 | 51,235 |
| යුක්රේනය | 952 | 38,607 |
| ඇ.එක්සත් ජනපදය | 14,053 | 34,690 |
| ජපානය | 10,075 | 31,505 |
| කැනඩාව | 10,258 | 30,926 |
| පකිස්තානය | 7,885 | 25,336 |
| නෙදර්ලන්තය | 13,030 | 22,281 |
| අනෙකුත් | 97,725 | 355,930 |
| **එකතුව** | **438,475** | **1,274,593** |

# ගෙවුම් තුලනය සැලකිය යුතු අතිරික්තයක් වාර්තා කළේය...





| | 2012 දෙසැම්බර් අග | | 2013 දෙසැම්බර් අග | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩොලර් මිලියන | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස | එ.ජ.ඩොලර් මිලියන | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස |
| වෙළෙඳ ශේෂය | - 9,417 | -15.9 | - 7,609 | -11.3 |
| ජංගම ගිණුමේ ශේෂය | - 3,982 | -6.7 | - 2,607 | -3.9 |
| සමස්ත ශේෂය | 151.2 | | 985.4 | |

# 2013 වසරේ දී දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 7.5 ක් දක්වා ඉහළ ගියේය...




| | 2012 දෙසැම්බර් අග | 2013 දෙසැම්බර් අග |
|---|---|---|
| දළ නිල සංචිත (එ.ජ.ඩොලර් මිලියන) | 7,105.9 | 7,495.3 |
| ආනයනික මාස | 4.4 | 5.0 |


# නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි ඉහළ උච්චාවචන පැවතියද ශ්‍රී ලංකා රුපියල 2013 වසරේ දී සාපේක්ෂව ස්ථායීව පැවතුණි...




- 2013 වසරේ දී රුපියල එ.ජ.ඩොලරයට සාපේක්ෂව සියයට 2.75 කින් අවප්‍රමාණය වී රුපියල් 130.75 ක් විය.
- මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් එ.ජ.ඩොලර් මිලියන 436 ක් මිල දී ගන්නා ලදී.

# ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම පහළයාම අවධානයට ලක්වූ කරුණක් විය...


- 2013 වසරේ දී රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,137 ක් දක්වා සියයට 8.2 කින් වර්ධනය විය.
- රජයේ ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ පැවති සියයට 13.9 සිට 2013 වසරේ දී සියයට 13.1 ක් දක්වා පහත වැටුණි.



# රාජ්‍ය ආයෝජන ඉහළ මට්ටමක පවත්වා ගත් අතර රජයේ මුළු වියදම තාර්කීකරණය කරන ලදී.

- රාජ්‍ය වියදම 2012 වසරේ පැවති සියයට 20.5 සිට 2013 වසරේ දී සියයට 19.2 දක්වා අඩු විය.
- පුනරාවර්තන වියදම් සියයට 14.9 සිට සියයට 13.9 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය.
- රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.5 ක මට්ටමක පවත්වා ගන්නා ලදී.

**රජයේ වියදම (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස)**



# අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් තවදුරටත් අඩු විය...

- 2013 වසරේ දී අයවැය හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 5.9 ක මට්ටමේ පවත්වාගත් අතර, එය මූලිකව ඇස්තමේන්තුගත සියයට 5.8 ට වඩා සුළු ඉහළ යාමකි.


**අයවැය හිඟය (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස)**



# අයවැය හිඟය ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කරන ලදී...


- අයවැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා විශාල වශයෙන් දේශීය මූලාශ්‍ර මත රැඳුනු අතර මුළු සමස්ත මූල්‍යයනයෙන් එය සියයට 76 ක් විය.

**අයවැය හිඟය මූල්‍යයනය (දළ.දේ.නි.ප්‍රතිශතයක් ලෙස)**



# අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව පෙන්නුම් කරමින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් රාජ්‍ය ණය අනුපාතය ද පහත වැටුණි...

- රාජ්‍ය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ වූ සියයට 79.2 සිට 2013 වසර අවසානය වන විට සියයට 78.3 දක්වා අඩු විය.



# 2013 වසරේ දී මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කරන ලදී...


## 2013 වසරේ ගනුලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ

- 2013 වසරේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100 කින් අඩු කරන ලදී.
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2 කින් සියයට 8 සිට සියයට 6 දක්වා අඩු කරන ලදී.

| | ප්‍රතිමිලදීගැනුම්* අනුපාතිකය | ප්‍රතිවිකුණුම්* අනුපාතිකය |
|---|---|---|
| මැයි - 2013 | 7.50% ↓ 7.00% | 9.50% ↓ 9.00% |
| ඔක්. - 2013 | 7.00% ↓ 6.50% | 9.00% ↓ 8.50% |
| ජන.2014 | | ↓ 8.00% |


*මෙම අනුපාතික පිළිවෙළින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය දීමේ පහසුකම් අනුපාතිකය ලෙස 2014 ජනවාරි මස සිට නම් කරන ලදී.

ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළෙඳපොළ පොලී අනුපාතික



# 2013 වසරේ දී මුදල් සැපයුම අපේක්ෂිත මට්ටම දෙසට ක්‍රමිකව අඩුවිය ...


- පුළුල් මුදල් සැපයුමෙහි සාමාන්‍ය වර්ධනය, 2012 වසරේ අවසානයේ පැවති සියයට 20.2 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 16.5 ක් දක්වා අඩුවිය.



# 2013 වසරේ දී පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණයෙහි වර්ධනය අඩු විය...


- වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පෞද්ගලික අංශයට ලබාදුන් ණය, 2012 අවසානයේ දී පැවති සියයට 17.6 ට සාපේක්ෂව 2013 අවසානයේ දී සියයට 7.5 දක්වා අඩු විය.
  - **කෘෂිකාර්මික සහ පාරිභෝජන ආශ්‍රිත අවශ්‍යතාවයන් සඳහා වූ රන් උකස් අත්තිකාරම් අඩුවිය.**
  - **කෙසේ වෙතත්, කාර්මික සහ සේවා අංශ වෙත ලබාදුන් ණය රුපියල් බිලියන 200 කින් ඉහළ ගියේය.**


**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය සහ අත්තිකාරම්හි ප්‍රමාණය සහ වර්ධනය**



# රාජ්‍ය සංස්ථා විසින් බැංකු අංශයෙන් ලබාගත් ණය ප්‍රමාණය අඩු වූ නමුත් රජය වෙත ලබාදුන් ණය ප්‍රමාණය අපේක්ෂිත මට්ටම ඉක්මවා ගියේය...

- 2012 වසරේ දී රුපියල් බිලියන 94 කින් ඉහළ ගිය රාජ්‍ය සංස්ථා වෙත ලබාදුන් ණය ප්‍රමාණයෙහි ප්‍රසාරණය 2013 වසරේ දී රුපියල් බිලියන 73 ක් දක්වා අඩු විය.
  - ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් දෙක විසින් සිදුකරන ලද ණය පියවීම්.
- 2013 වසරේ දී රජය වෙත ලබාදුන් ශුද්ධ ණය ප්‍රමාණය අපේක්ෂිත මට්ටම ඉක්මවා ගියේය.





# වත්කම් සහ ශාඛා ජාලය ව්‍යාප්ත කරමින් මූල්‍ය අංශය ස්ථායීව පැවතුණි...

- ණය වර්ධනය අඩුවීම හමුවේ වුවද බැංකු, මුදල් සමාගම් සහ ලීසිං සමාගම් ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කළේය.

බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය





බැංකු අංශයේ ලාභදායිත්ව දර්ශකය



# විදේශ ආයෝජන ඉහළයාමත් සමඟ 2013 වසරේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ වර්ධනයක් වාර්තා කළේය...

- සමස්ත කොටස් මිල දර්ශකය සහ S&P 20 දර්ශකය පිළිවෙළින් සියයට 4.8 කින් හා සියයට 5.8 කින් ඉහළ ගියේය.
- වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් ට්‍රිලියන 2.2 සිට රුපියල් ට්‍රිලියන 2.5 ක් දක්වා වර්ධනය විය.
- එ.ජ.ඩොලර් මිලියන 179 ක ශුද්ධ විදේශීය ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය.
- සාංගමික ණය වෙළෙඳපොළ කටයුතු ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි කොටස් මිල දර්ශක සහ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය




සාංගමික ණය වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| ණයකර නිකුත් කිරීම් සංඛ්‍යාව | 1 | 9 | 83 |
| ණයකරවල වටිනාකම (රුපියල් බිලියන) | 1.0 | 12.5 | 69.1 |

# මැදිකාලීන සාර්ව ආර්ථික පුරෝකථන

| දර්ශකය | ඒකකය | 2013 (ඇස්තමේන්තු) | පුරෝකථන | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2014 | 2015 | 2016 | 2017 |
| **මූර්ත අංශය සහ උද්ධමනය** | | | | | | |
| මූර්ත ද.දේ.නි.යේ වර්ධනය | සියයට | 7.3 | 7.8 | 8.2 | 8.3 | 8.4 |
| මතුපිට උද්ධමනය | සියයට | 4.7 | 5.0 | 4.5 | 4.0 | 4.0 |
| ඒක පුද්ගල ද.දේ.නි. | එ.ජ.ඩොලර් | 3,280 | 3,718 | 4,243 | 4,825 | 5,485 |
| **විදේශ අංශය** | | | | | | |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස | -3.9 | -2.5 | -0.9 | 0.1 | 0.2 |
| සමස්ත ශේෂය | එ.ජ.ඩොලර් මිලියන | 985 | 1,510 | 2,185 | 2,967 | 3,606 |
| විදේශීය නිල සංචිත | එ.ජ.ඩොලර් මිලියන | 7,495 | 8,251 | 9,883 | 12,349 | 15,693 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | | | |
| සමස්ත අයවැය හිඟය | ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස | -5.9 | -5.2 | -4.4 | -3.8 | -3.8 |
| රාජ්‍ය ණය | ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස | 78.3 | 74.3 | 70.6 | 65.0 | 62.0 |
| **මූල්‍ය අංශය** | | | | | | |
| පුළුල් මුදල්හි වර්ධනය ($M_{2b}$) | සියයට | 16.7 | 14.0 | 14.0 | 14.0 | 14.0 |

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව